# සභාවේ ධර්මදූත සේවාව (**DECREE ON THE MISSION ACTIVITY OF THE CHURCH -** ***AD GENTES***) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නියෝගයඃ ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්

එස්. කේ. ද සිල්වා

බටහිර සම්භාව්‍යය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලෙස ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකි වේ. ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ ඉහත සඳහන් ප්‍රාථමික මූලාශ්‍රය භාවිතයට ගෙන එම මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ **සභාවේ ධර්මදූත සේවාව පිළිබඳ ලියැවිල්ල** සකස් වූ ආකාරය හා එයට පසුබිම් වූ කරුණු පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙහි පර්යේෂණ අරමුණ වේ.

සභා ධර්මදූත සේවාවේ දේවධර්මවාදී මූලධර්ම, ධර්ම ප්‍රචාරය, ධර්ම ප්‍රචාර සංවිධානය කිරීම, එහි ක්‍රියාකාරිත්වය සහ සහයෝගීතාව පිළිබඳ විවාද රැසක් මෙම ප්‍රකාශනය ඇසුරින් පෙන්වා දී ඇත. නූතන ලෝකයේ ධර්ම ප්‍රචාරය යනු කුමක් ද එය කුමන මානයන්ගෙන් සමන්විත ද එය පවත්වාගෙන යා යුත්තේ කෙසේ ද යන කරුණු මෙහි විස්තර වේ.

මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ ධර්ම ප්‍රචාරය සඳහා මුල් සභාවට ක්‍රමවත් සැලසුමක් තිබූ නමුත් ක්‍රිස්තියානිත් තුළ සැබෑ සංවර්තනයක් සිදු වී නැත්තේ මන්ද යන්න විමසීම යි. එලෙස ම සභාවේ මුල් කාලයේ දී පැවති දේව ධර්මයේ අඩුපාඩු ධර්ම ප්‍රචාරයට බලපෑ අතර එකල ධර්ම ප්‍රචාරයේ පැවති දුර්වලතා වත්මන් පසුබිම මත ද සභාව තුළ පවතින්නේ මන්ද යන්න විමසීම ය.

**මූලික පදඃ** දෙවන වතිකාන මන්ත්‍රණ සභාව, ධර්ම ප්‍රචාරය, සංවර්තනය